**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 23 දින ද සභාපතිවරයාට යවා ඇත**.**

1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාව සතුව පවත්නා ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතුවේ. | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ කමිටුවක් පත්කර සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින අතර. 2019 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| (ii) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.2,691,829 ක් වු පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොගය ගිණුම්ගත කල යුතුවේ. | පොත් අගය හා භෞතික තොගය යන ශේෂයන් දෙකම සලකා බලා ගිණුම්ගත කිරිමට කටයුතු කරනු ලැබේ. |

(ආ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ රු.857,690 ක් වු අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම්වල ගැලපිමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) වර්ෂ 08 කට පෙර සිට පැවත එන එකතු කල අගය මත බදු (vat) ලෙස පවතින රු.410,901 ක මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරිමට කටයුතු කල යුතුවේ. | වැට් බදු ශේෂයට අදාල තොරතුරු දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර 2019 වර්ෂයේදී මෙම ශේෂය නිරවුල් කිරිමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ii) 2015 හා 2016 වසරවල සිට පැවත එන පිළිවෙලින් රු.71,451 ක හා රු.1,241,665 ක කර්මාන්ත ණයගැති ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරිමට කටයුතු කල යුතුවේ. | පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් මුදල් ඉල්ලුම් කර ඇති අතර මුදල් ලැබුණු පසු ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (iii) 2015 හා 2017 වර්ෂ වෙනුවෙන් කර්මාන්ත ණයහිමියන් වෙත ගෙවිය යුතු රු.1,517,328 ක මුදල නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරි ගිණුම් වර්ෂය තුල නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (i) 134(1) වගන්තිය | - | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටි නිශ්චල දේපලවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුවේ. | 2020 වර්ෂයේදී වසර 05 කට වරක් සිදු කරන වරිපනම් බදු ප්‍රතිශෝධනය අනුව කටයුතු සිදු කිරිමට යෝජිතය. |
| | (ii) 160 වගන්තිය | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනත අනුව කටයුතු කල යුතුවේ. | රතු නිවේදන නිකුත් කරමින් පවතින අතර, දේපල තහනම් කිරිම් ක්‍රියා මාර්ග දක්වා |

කටයුතු කරමින් පවති.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 218 | - | සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | ඉඩම් ගොඩනැගිලි පිලිබඳ කමිටුවක් පත් කර සමීක්ෂණයක් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015දෙසැම්බර් 28 දිනැති අංක 1888/47 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | 48,100 | සභා බල ප්‍රදේශය තුල සවිකර ඇති දැන්වීම් පුවරු 30 කට අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් පත්‍රයට අනුව කටයුතු කල යුතුවේ. | අදාල නාම පුවරු සඳහා ගාස්තු ගෙවන ලෙස හිමිකරුවන් වෙත ලිඛිතව දැනුම් දී ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,318,814 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,069,143 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,538,767 | 3,147,502 | 2,927,209 | 708,683 | 3,453,767 | 3,299,717 | 2,669,707 | 980,244 |
| (ii) | කුලී | 4,960,000 | - | 650,110 | - | 4,760,000 | - | 785,470 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 610,000 | 350.000 | 716,443 | - | 560,000 | 548,995 | 601,765 | - |
| (iv) | වෙනත් ආදායම් | 21,580,000 | - | 13,577,105 | - | 21,520.000 | - | 15,390,670 | - |

2.2.2 වරිපනම් හා බදු

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.1,180,885 ක් වු අතර වර්ෂය තුලදී ඉන් රු.543,743 ක් පමණක් අයකර ගෙන තිබුණි. | හිඟ ආදායම් අය කිරිමට කටයුතු කල යුතුවේ. | අදාල හිඟය අයකර ගැනීම සඳහා මේ වන විට රතු නිවේදන නිකුත් කර ඇති අතර විනිග්‍රහ බලපත්‍ර නිකුත් කර දේපල තහනම් කිරිමේ ක්‍රියාවලිය දක්වා ක්‍රියා කිරිමට පවති. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට රු.1,226,240 ක් වු හිඟ වරිපනම් මුදල 2019 ජූනි 30 වන විට රු.875,122 ක් දක්වා අඩුවී තිබුණු අතර එම ශේෂය තුළ වසර 01 සිට 03 දක්වා ඒකක 1043 කින්, රු.661,320 ක්, වසර 03 සිට 05 දක්වා ඒකක 240 කින් රු.195,213 ක් හා වසර 05 සිට වසර 10 දක්වා ඒකක 25 කින් රු.18,589 ක හිඟයක් ඇතුලත් විය. | හිඟ ආදායම අය කිරිමට කටයුතු කල යුතුවේ. | හිඟ ආදායම් රැස් කිරිමට කටයුතු කරමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පිළිවෙලින් රු.12,689,345 ක් හා රු.5,735,667 ක් විය. මුද්දර ගාස්තුවලින් කිසිදු මුදලක් ලැබී නොතිබුණු අතර 2017 වර්ෂයට අදාළව උසාවි දඩ රු.5,527,115 ක් ලැබී තිබුණි. | අදාල ආදායම් ලබා ගැනිමට කටයුතු කල යුතුවේ. | 2017 වර්ෂයට අදාල මුද්දර ගාස්තු උපලේඛන සකස් කර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට භාරදී ඇති අතර 2018 වර්ෂයේ උපලේඛන මේ වන විට සකස් කරමින් පවති.ඒ අනුව අදාල මුදල් මෙම වර්ෂය තුල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) ක්‍රියාකාරි සැලැස්ම** | | |
| (i) භෞතික සැලසුම් හා මංමාවත් යටතේ මාර්ග අළුතින් ඉදිකිරිම සඳහා අයවැය ලේඛනය මගින් රු.මි.2.5 ක ප්‍රතිපාදන වෙන් කලද , ක්‍රියාකාරි සැලැස්ම තුල ඒ සඳහා ව්‍යාපෘති හදුනා නොගෙන 2018 වර්ෂය තුල රු.මි.1.17 ක පිරිවැය වු ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කර තිබුණි. | අයවැය ප්‍රතිපාදන යටතේ හදුනාගත් ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්ම තුලින් ක්‍රියාත්මක කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ආ) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත නිමැවුම හා ප්‍රතිඵල අතර කාර්ය සාධනය ඇගයිම කල යුතු වුවද , වැඩ සටහන් 05 ක් යටතේ රු.මි. 108.64 ක අයවැය ප්‍රතිපාදන සඳහා ක්‍රියාකාරකම් 131 ක් හඳුනාගෙන වගකීම් හා අධීක්ෂණ කටයුතු සඳහා වගකිව යුතු නිලධාරින් පත්කර තිබුණ ද එම ක්‍රියාකාරකම් ඉටු කිරිමේ ප්‍රගතිය මැන බැලීමේ ක්‍රමවේදයන් සභාව සතුව නොතිබුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කාර්ය සාධන ඇගයිම් සිදු කිරිමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| **(ආ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියත්,එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා 2018 දෙසැම්බර් 31 දින වන විට දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම් පවරා නොතිබුණි. | තිරසාර ඉලක්ක ඉටු කිරිමට අදාල දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිතව වගකීම පවරා දිය යුතුවේ. | මේ සම්බන්ධයෙන් සභාව දැනුවත් වුයේ 2019 ජනවාරි 24 දින පැවති වැඩ මුළුවේදීය. එම හේතුව මත 2018 වසරේ දිගු කාලීන සැලසුම් සකස් කර නිශ්චිත වගකීම් පවරා නැත. 2019 වසරේ අදාල කාර්යයන් සිදු කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ගිණුමේ පවතින රු.4,675,992 ක බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| (අ) 2019 ජුලි 01 දින සිට පුස්තකාලයාධිපති ,ආදායම් පරීක්ෂක, පෙර පාසැල් ගුරු, වැඩ පරීක්ෂක , සෞඛ්‍ය පරීක්ෂක , යන්ත්‍ර ක්‍රියාකරු තනතුරුවල එක් අයෙකු බැගින් පුරප්පාඩු පැවතුණි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනිමට කටයුතු කල යුතුවේ. | පුස්තකාලාධිපති තනතුර සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට දන්වා ඇත. ආදායම් පරීක්ෂක තනතුරේ නඩුවත් පවතින බැවින් බඳවා ගැනීම් අත්හිටුවා ඇත. ඉතිරි තනතුරු සඳහා ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) වසරකට වඩා වැඩි කාලයක සිට සේවකයින් 03 දෙනෙකුගෙන් අය නොවන සේවක ණය ශේෂය රු.82,002 ක් විය. | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | ණය අයකර ගැනිමට අදාල කටයුතු සිදු කරමි. |

3.4 වත්කම් කළමණාකරණය

--------------------------------

3.4.1 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| සභාව විසින් රු.35,399,870 ක වියදමක් දරා 2016 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කර තිබූ නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල 2019 මැයි 31 දින වන විටත්, උපයෝජනයකින් තොරව පැවතුණි. | ඵලදායි ලෙස ආදායම් ඉපයිමේ කාර්යය සඳහා යොදවා ගත යුතුවේ. | විදුලි පහසුකම් ලබා ගැනීමේ අපහසුව මත මෙම කාර්යය සිදු නොකල අතර , මේ වන විට එම කාර්යය ඉටු කරමින් පවතී. |

3.5 ප්‍රසම්පාදනය

---------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් 2019 වසරේ පිළියෙල කිරිමට කටයුතු කරමි. |

3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ---------------------- |
| (අ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තිය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ කොන්ත්‍රාත් පිරිනැම්මේදී චක්‍රලේඛය ප්‍රකාරව සිදු නොකර රු.1,192,201 ක මුදලක් කොන්ත්‍රාත් සමිති වෙත ගෙවා තිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කල යුතුවේ. | ඉදිරියේදි මෙම තත්ත්වය නිවැරදි කර කමිටුවක් මගින් අදාල නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) මිල්ලගහවිල පන්සල අසල පොදු මාර්ගය සංවර්ධනය කිරිම සඳහා කළණ මිතුරු සුහ සාධක සංගමය වෙත රු.296,236 ක් ගෙවා තිබුණ ද, ඉදිකිරිම් භෞතික පරික්ෂා කිරිමේදී මාර්ගයේ ගල් මතුවී ගුණත්වය අඩු මට්ටමක පැවතුණි. | කොන්ත්‍රාත් වෙනුවෙන් ගෙවීම් කිරිමට පෙර ඒවායේ ගුණත්වය නිවැරදිව භෞතිකව පරික්ෂා කර ගෙවිම් කල යුතුවේ. | මෙම තත්ත්වය නිවැරදි කිරමට කටයුතු කරමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය
--------------------------------------
4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ
--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 විගණකාධිපති වාර්තාවේ 4.1.1 හා 2017 විගණකාධිපති වාර්තාවේ 2.2.1 (ඌ),(එ),(ඒ),(ඔ),(ඕ),(ක) හා (ග) යන විගණන ඡේදයන් නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරිම් කල යුතුවේ. | අදාල නිවැරදි කිරිම් ඉදිරි ගිණුම් වර්ෂය තුලදී සිදු කිරිමට කටයුතු කරමි. |